# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 30 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 නොවැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 1. 05 යි.

තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1996 අංක 30 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 නොවැම්බර් මස 12 වන දින]

එල්. ඩී.— ඕ. 54/95

## 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 30 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. — *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 26 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — *1991 අංක 37 දරන පනතේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(ඇඇ) 46ආ වගන්තියෙහි සඳහන් සමාගමකට දෙන ලද අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ, මුදල් අධ්‍යක්ෂ, මෙහෙයුම් අධ්‍යක්ෂ සහ ඉංජිනේරු අධ්‍යක්ෂ විසින් දැරිය යුතු අවම අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් ; ඒ සුදුසුකම් නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය ;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති පිළිවෙලින්, 46අ, 46ආ, 46ඇ, 46ඈ, 46ඉ, 46ඊ, 46උ සහ 46ඌ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ, 46ආ, 46ඇ, 46ඈ, 46ඉ, 46ඊ, 46උ සහ 46ඌ වගන්ති ඇතුළත් කිරීම.*

"ජනතාකරණය කරන ලද සමාගම ඒකාබද්ධ කිරීම සඳහා අමාත්‍යවරයා විසින් විධාන නිකුත් කළ හැකි බව. — 46අ. පොදුවේ ජාතික ආර්ථිකය ද, විශේෂයෙන් මහජනතාවට ප්‍රමාණවත් බස් රථ ප්‍රවාහන සේවා සැපයීමේ අවශ්‍යතාව ද සැලකිල්ලට ගෙන මේ පනතේ දෙවන උපලේඛනයේ සඳහන් ජනතාකරණය කරන ලද සමාගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඒකාබද්ධ කිරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් සමාගම්

2—ඩී 041486-6,105 (96/10)

රෙජිස්ට්‍රාර්වරයා වෙත කරනු ලබන විධානයක් මගින්, ඒ විධානයේ සඳහන් ජනතාකරණය කරන ලද සමාගම් විසින් කරගෙන යන ලද ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා අලුත් සමාගමක් ලියාපදිංචි කරන ලෙස වූ ඒ විධානය ද සමග, සාංගමික සංස්ථාපත්‍රයක් හා සාංගමික ව්‍යවස්ථාවලියක් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

46අ වගන්තිය යටතේ වූ විධානයක් මත සමාගම් රෙජිස්ට්‍රාර්-වරයාගේ කර්තව්‍ය.

46ආ. 1982 අංක 17 දරන සමාගම් පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් ව ඇත ද, 46අ වගන්තිය යටතේ අමාත්‍යවරයාගෙන් විධානයක් ලැබුණු විට, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් —

(අ) ඒ විධානයේ සඳහන් නමින් සමාගමක් (ඒ සමාගම, මෙහි මින් මතු "අලුත් සමාගම" යනුවෙන් හඳුන්වනු ලැබේ) ලියාපදිංචි කර ඒ සමාගම සම්බන්ධයෙන්, ඒ පනතේ 15(1) වන වගන්තිය යටතේ සංස්ථාගත කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය;

(ආ) නියමයේ සඳහන් ජනතාකරණය කරන ලද සමාගම් විසින් කරගෙන යන ලද ව්‍යාපාර කටයුතු භාරගෙන කරගෙන යාම සඳහා නියමයේ සඳහන් නාමයෙන් පොදු සමාගමක් ඒ පනත යටතේ සංස්ථාගත කර ඇතැයි ගැසට් පත්‍රයෙහි නියමයක් පළ කරනු ලැබිය යුතු ය.

අලුත් සමාගම්වල කොටස් වෙන් කර දීම.

46ඇ. 46ආ වගන්තිය යටතේ නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ නියමයේ සඳහන් ජනතාකරණය කරන ලද සමාගමක සෑම කොටස් හිමියකු වෙත ම, ඒ කොටස් හිමියා විසින් ජනතාකරණය කරන ලද සමාගමේ දරන ලද කොටස්වල නාමික වටිනාකමට හැකිතාක් දුරට සමාන කොටස් ප්‍රමාණයක් අලුත් සමාගමෙහි වෙන් කර දෙනු ලැබිය යුතු ය.

46ආ වගන්තිය යටතේ කරන ලද නියමයක බලපෑම.

46ඇ. 46ආ වගන්තිය යටතේ නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දිනයේ සිට බලපැවැත්වෙන පරිදි —

(අ) ඒ නියමයේ සඳහන් සෑම ජනතාකරණය කරන ලද සමාගමක් විසින් ම, 45 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ඈවරකර ඇතැයි සලකනු ලැබිය යුතු අතර, ඒ සමාගමේ නම, තමා විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනවලින් කපා හැරීම පිණිස සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් පියවර ගනු ලැබිය යුතු ය ;

(ආ) ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි ඒ නියමයේ සඳහන් ජනතාකරණය කරන ලද සමාගමක් සතු වූ වංචල හෝ නිශ්චල සියලු දේපළ ඒ නියමයේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඒ නියමයේ සඳහන් අලුත් සමාගම සතු විය යුතු ය ;

(ඇ) ඒ නියමයෙහි සඳහන් වන්නා වූ ද, ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි පවත්නා වූ ද, ජනතාකරණය කරන ලද සමාගමක් විසින් ඇතුළත් වන ලද සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්, ඒ නියමයේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඒ නියමයේ සඳහන් සමාගම විසින් ඇතුළත් වන ලද කොන්ත්‍රාත්තු හා ගිවිසුම් වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ඈ) ඒ නියමයෙහි සඳහන් වන්නා වූ ද, ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි පවත්නා වූ ද, ජනතාකරණය කරන ලද සමාගමක සියලු බැරකම් ඒ නියමයේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඒ නියමයේ සඳහන් අලුත් සමාගමේ බැරකම් වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ඉ) ඒ නියමයෙහි සඳහන් ජනතාකරණය කරන ලද සමාගමක් විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද්ද වූ ද, ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි විනිශ්චයට භාජනව පවත්නා වූ ද, සියලු නඩු හා නීති කෘත්‍ය, ඒ නියමයේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඒ නියමයේ සඳහන් අලුත් සමාගම විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද නඩු හා නීති කෘත්‍ය වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ නඩු හා නීති කෘත්‍ය පවත්වා ගෙන යනු ලැබිය හැකි ය ;

(ඊ) ඒ නියමයේ සඳහන් ජනතාකරණය කරන ලද සමාගමක් විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් ඇතුළත් කරන ලද හෝ කරන ලද්දා වූ ද, ඒ නියමයේ දිනයට ඉහතින් වූ දිනයෙහි ඉටු නොකර පවත්නා වූ ද, සියලු තීන්දු ප්‍රකාශ හා තීරණ, ඒ නියමයේ දිනයෙහි සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි, ඒ නියමයේ සඳහන් අලුත් සමාගමේ වාසියට හෝ ඊට විරුද්ධව ඇතුළත් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශ හෝ තීරණ වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ තීන්දු ප්‍රකාශ හෝ තීරණ ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකි ය.

18 වන වගන්තිය අලුත් සමාගම්වලට අදාළ නොවිය යුතු බව.

46ඉ. බලයලත් තැනැත්තකු හෝ කොමිෂන් සභාව හෝ විසින් අලුත් සමාගමක් ලියාපදිංචි අයිතිකරු වන බස් රථයක් සම්බන්ධයෙන් මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම, 18 වන වගන්තියෙහි ඇතුළත් කිසිවකින් තහනම් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

අලුත් සමාගමකට කොමිෂන් සභාව විසින් විධාන කරනු ලැබිය හැකි බව.

46ඊ. බස් රථ ධාවනය කිරීම සඳහා වූ කාල සටහන්වලට අනුකූලව යම් සමාගමක් විසින් ක්‍රියා කරනු ලබන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන කොමිෂන් සභාව විසින් යම් අලුත් සමාගමක් වෙත

දෙනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ දෙනු ලබන විධාන අනුව ක්‍රියා කිරීම, සෑම අලුත් සමාගමක ම කාර්යය විය යුතු ය.

ආණ්ඩුව ඇපවීම.

46උ. (1) අලුත් සමාගමක් වෙත ප්‍රදානය කරන ලද ණයක්, අයිරාවක් හෝ වෙනත් සහනයක් හෝ අලුත් සමාගම විසින් නිකුත් කරන ලද සෑණ පත්‍ර මත අයවීමට ඇති යම් මුදලක් සම්බන්ධයෙන්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ඇප විය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් සපයන ලද ඇපවීමක් ඉටු කිරීමෙහි ලා අවශ්‍ය යම් මුදලක්, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇපවීමක් ඉටු කිරීමෙහි ලා ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබූ යම් මුදලක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් අනුපාතයක් අනුව වූ පොලියක් ද සමග, ඒ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා යම් කාලයක් තුළ අලුත් සමාගම විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඇපයක් සපයනු ලැබීමෙන් ඉක්බිතිව ම, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, ඇපවීම පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇපවීමක් ඉටු කිරීමෙහි ලා ඒකාබද්ධ අරමුදලින් යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක, මුදල ගෙවා ඇති බවට වූ ප්‍රකාශයක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, වහාම පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබිය යුතු ය.

මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සීමා කිරීම.

46ඌ. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට හෝ ඉන් පසුව, නියම කරනු ලැබිය හැකි යම් මාර්ගවල හෝ මාර්ග පංතිවල

බස්රථ ධාවනය කිරීම සම්බන්ධයෙන් වන විට හැර, මගීන් ගෙන යාම සඳහා බස් රථයක්, පාවිච්චි කිරීමේ බලය දෙමින් වූ මගී සේවා අවසර පත්‍රයක්, බලය ලත් තැනැත්තකු හෝ කොමිෂන් සභාව විසින් ගෙන යන මගීන් හතලිහකට නොඅඩු සංඛ්‍යාවකට අනුන්ගත හැකි බස් රථයක් සම්බන්ධයෙන් පමණක්, නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීම, නියමිත මගී සංඛ්‍යාවට වඩා අඩු මගී සංඛ්‍යාවක් ගෙන යාම පිණිස සැලසුම් කරන ලද බස්රථයක් සම්බන්ධයෙන්, ඒ නියමයේ දිනට පෙරාතුව නිකුත් කරන ලද, මගීන් ගෙන යාම සඳහා බස්රථයක් යොදා ගැනීමට බලය දෙන මගී සේවා අවසර පත්‍රයක් ඒ නියමයේ දිනයෙන් පසුව අලුත් කිරීම තහනම් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(3) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන යම් නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට අවුරුදු පහක් ඉකුත්වීමෙන් පසුව, නියම කරනු ලැබිය හැකි යම් මාර්ගයක් හෝ මාර්ග පංති සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වන විට හැර, මගීන් ගෙන යාම සඳහා බස්රථයක් පාවිච්චි කිරීමට බලය දෙන මගී සේවා අවසර පත්‍රයක්, බලයලත් තැනැත්තකු හෝ කොමිෂන් සභාව විසින්, යටත් පිරිසෙයින් බස්රථ පණහක් හෝ අයත් වන්නා වූ ද, ධාවනය කරවන්නා වූ ද, තැනැත්තකු වෙත හෝ පුද්ගල මණ්ඩලයක් වෙත පමණක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මගීන් ගෙන යාම සඳහා බස් රථයක් යොදා ගැනීමට අවසර දෙමින්, මගී සේවා අවසර පත්‍රයක් හෝ සමාන අධිකාරයක් නිකුත් කිරීමට බලය දෙන මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ, යෙදෙන "මේ පනතේ උපලේඛනයේ" යන වචන වෙනුවට, "මේ පනතේ පළමුවන උපලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ ශීර්ෂය ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

"පළමුවන උපලේඛනය".

6. ප්‍රධාන ප්‍රඥප්තිය අගට පහත දැක්වෙන උපලේඛනය එකතු කිරීමෙන්, ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් උපලේඛනයක් ඇතුළත් කිරීම.

"දෙවන උපලේඛනය (46අ වගන්තිය)

නිගම්බෝ පැසෙන්ජර් ට්‍රාන්ස්පෝර්ට් සර්විසස් ලිමිටඩ්.
රත්මලාන පැසෙන්ජර් ට්‍රාන්ස්පෝර්ට් සර්විසස් ලිමිටඩ්.
සීමාසහිත මහනුවර දකුණ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
අවිස්සාවේල්ල පීපලයිස්ඩ් පැසෙන්ජර් ට්‍රාන්ස්පෝර්ට් සර්විසස් ලිමිටඩ්.
සීමාසහිත කුරුණෑගල දකුණ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මහනුවර උතුර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කතරගම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත නිට්ටඹුව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කැප්පෙටිපොල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත බලංගොඩ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත හොරණ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත වාරියපොල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ගල්ගමුව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අලව්ව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කුරුණෑගල උතුර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ගිරිඋල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත වෙන්නප්පුව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත නිකවැරටිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත පුත්තලම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත හලාවත ජනතා සන්තක ප්‍රවාහන සේවය.

සීමාසහිත මහව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කුලියාපිටිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත බණ්ඩාරවෙල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත වැල්ලවාය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මොණරාගල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත බිබිල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත බදුල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මහියංගනය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අනුරාධපුර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කැකිරාව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කහටගස්දිගිලිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කැබිතිගොල්ලෑව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත පොළොන්නරුව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ගාල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මාතර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ඇල්පිටිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අකුරැස්ස ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත තංගල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අම්බලන්ගොඩ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කලවාන ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ඇඹිලිපිටිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ගොඩකවෙල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත රත්නපුර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත දැරණියගල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කෑගල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මාවනැල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත රඹුක්කන ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත වත්තේගම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත යටිනුවර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ගම්පොල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත හඟුරන්කෙත ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත වලපනේ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත දඹුල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මාතලේ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත හැටන් ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත නුවරඑළිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත නාවලපිටිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.

සීමාසහිත පානදුර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කලුතර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මොරටුව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත හෝමාගම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කැස්බෑව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මහරගම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත උඩහමුල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මතුගම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අලුත්ගම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත හක්මන ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මීතොටමුල්ල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත වැලිසර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මට්ටක්කුලිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත දිවුලපිටිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ජා-ඇල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත තලංගම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ගම්පහ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කැලණිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කිරිදිවැල ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අංගොඩ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කඩවත ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කන්තලේ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අම්පාර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත උඩදුම්බර ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අක්කරෙයිපත්තුව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කල්මුණේ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත අම්බලන්තොට ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත වව්නියාව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත ත්‍රිකුණාමලය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත උඩුගම ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත තෙල්දෙනිය ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කොත්මලේ ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත කටුබැද්ද ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත වාලච්චේන ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මඩකලපුව ජනතා සන්තක ප්‍රවාහන සේවය.
සීමාසහිත මුත්තූර් ජනතා සන්තක ප්‍රවාහන සේවය.".

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.